**පිළිතුරු පත්‍රය - 2018 දෙවන වාර පරීක්ෂණය**
**11 ශ්‍රේණිය - I කොටස**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **01** | 1 | **11** | 2 | **21** | 1 | **31** | 4 |
| **02** | 4 | **12** | 4 | **22** | 3 | **32** | 1 |
| **03** | 1 | **13** | 1 | **23** | 3 | **33** | 4 |
| **04** | 3 | **14** | 3 | **24** | 2 | **34** | 2 |
| **05** | 4 | **15** | 3 | **25** | 3 | **35** | 2 |
| **06** | 3 | **16** | 2 | **26** | 1 | **36** | 1 |
| **07** | 2 | **17** | 1 | **27** | 3 | **37** | 3 |
| **08** | 3 | **18** | 3 | **28** | 3 | **38** | 1 |
| **09** | 2 | **19** | 1 | **29** | 3 | **39** | 3 |
| **10** | 1 | **20** | 3 | **30** | 3 | **40** | 3 |

**IIකොටස**

01.

I. පන්සිය පනස් ජාතක පොත
උම්මග්ග ජාතකය (ල.02)

II. බහුබූතයාගේ පැමිණීම , පූර්ව රංගය , මංගලම් ගීතය ගැයීම. (ල.02)

III. කාලගෝල හා දික්තලා අතර ගැටුම
දික්පිටියා හා කාලගෝල අතර ගැටුම (ල.02)

IV. දික්තලා රූමත් කාන්තාවක් වන අතර , කාලගෝල කළු මිටි අවලස්සන අයෙකි.
ඔවුන්ගේ ප්‍රධාන නොගැළපීම බාහිර පෙනුමයි. (ල.02)

V. චතුතදත්ත (ල.02)

VI. දික්තලා දික්පිටියාට බාර දීම. (ල.02)

02.

I. පිලිප්පු සිඤ්ඤෝ , ඇහැලේපොල හෙවත් සිංහලේ නාඩගම (ල.03)

II. දක්ෂිණ භාරතීය තෙරික්කුත්තු හෙවත් වීථි නාට්‍යයන්හි ආභාසයෙන් බිහි වූ බව හා
යටත් විජිත සමයේ මිෂනාරි ආගම් ප්‍රචාරය කිරීමේ මාධ්‍යයක් ලෙස ජනවන්ත නාට්‍ය වල
ආභාසය , දේශීය කවි නාඩගම් වල ආභාසය (කරුණු දෙකක් ප්‍රමාණවත් ය.) (ල.04)

III. *පූර්ව රංගයක් පැවතීම. - එහිදී බහු බූතයා සෙල්ලම් ළමා බෙර වයන්නන් හා අනාගත වත්කම හා හඬ දූතයන් කරළියට පැමිණීම.
* දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීතයේ රාග තාල අනුව ගීත හා සංගීතය නිර්මාණය වී තිබීම.
* පොතේ ගුරු හා ගායක කණ්ඩායමක් විසින් නාටකය ඉදිරිපත් කරනු ලැබීම.
* නාඩගම්කතාව දින 3 – 7 කාලයක් රඟ දැක්වීම.
* ගැහැණු චරිතද පිරිමින් විසින් රඟ දැක්වීම.
* කිට්සන් පහන් හා පන්දම් ආලෝකය භාවිතා කිරීම.
* වාද්‍ය භාණ්ඩ වශයෙන් හොරණෑව , මද්දගය , කයිතාලම , රවිකිඤ්ඤය ආදිය භාවිතා කිරීම.
* කරළිය නම් අර්ධ කවාකාර රංග භූමිය භාවිතා කිරීම.
( කරුණු පහක් ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.) (ල.05)

03.

I. අභිරූපණය යනුවෙන් හැඳින්වෙන්නේ ආංගිකාභිනය මූලික කරගෙන වාචිකාභිනයෙන් තොරව යම්කිසි දෙයක් හෝ ක්‍රියාකාරකමක් නිර්මාණශීලීව රඟදක්වා පෙන්වීම යි.
අභිනයද මේ සඳහා යොදා ගන්නා අතර අතිශයෝක්තිය ඉදිරිපත් කිරීමක් සිදුවේ. (ල.03)

II. * සැහැල්ලු ඉදිරි ගමන * පැති ගමන
* දුෂ්කර ගමන * ආපසු ගමන (ල.04)

III. අභ්‍යන්තර ශිල්ප ක්‍රම

බාහිර ශිල්ප ක්‍රම

අභ්‍යන්තර ශිල්ප ක්‍රම යනු අභිරූපණ රංගනයට අදාළ කරගත් සිදුවියේ අවස්ථාවන් පිළිබඳව ඉතා සියුම් මනසින් මෙනෙහි කිරීමයි.

බාහිර ශිල්ප ක්‍රම යනු මනසින් නිර්මාණය කර ගත් සිද්ධිය සිරුර උපයෝගී කර ගෙන ඉදිරිපත් කිරීමයි.
(ල.05)

04.

I. කොහොඹා කංකාරිය (ල.03)

II. නානුමුරය , කපුයක්කාරියවිජය රජු කුවේණියට දෙන ලද ප්‍රතිඥාව කඩ කරන අතර එයින් කුපිත වූ කුවේණිය ශාප කරනු ලබයි.එය විජයගෙන් පසු රජ පැමිණි පඬුවස්දෙව් රජුට බලපාන අතර රජු සිහිනයෙන් දිවියෙකු දැක බියට පත් වෙයි.එයින් රජු රෝගාතුර වන අතර ඔහු සුව කිරීම සඳහා මලය රජු ගෙන්වා යාගයක් කළ යුතු බව ශක්‍ර දෙවිඳු ප්‍රකාශ කරයි.ඌරු වෙස්ගත් රාහු අසුරේන්ද්‍රයා මලය රජුගේ උයන පාලු කොට ඔහුගේ අවධානය තමා වෙත යොමු කරවා ගනිමින් ලක්දිව හන්තාන් නම් ස්ථානයට ඔහු රැගෙන එයි. මෙහිදී පඬුවස්දෙව් රජුගේ දිවි දොස දුරු කරන ලෙස සක් දෙවිඳු මලය රජුට පවසයි.ඒ අනුව කොහොඹා කංකාරිය සිදු කර රජු සුවපත් කළ බව උපත් කතාවයි. (ල.04)
( මෙවන් අදහස් සිසුන් ගොනු කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.)

III. ඌරා යක්කම , නයා යක්කම , වාදියක්කම , සීතා යක්කම , දර්පණ යක්කම , ගබඩා කොල්ලය , ගුරුගේ මාලාව

යන නාට්‍යමය අවස්ථාවන් එකක නාට්‍යමය ලක්ෂණ විස්තර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.
(ල.05)

5.

I. එළිමහන් රංග භූමි , ගෘහස්ථ රංග භූමි (ල.02)

උඩ

(ල.04)

දකුණ වම

| | | |
|---|---|---|
| 7 | 8 | 9 |
| 6 | 5 (ල.04) | 4 |
| 1 | 2 | 3 |

යට

1. පහළ දකුණ 2. පහළ මැද 3. පහළ වම 4. මැද වම
5. මැද මැද 6. මැද දකුණ 7. උඩ දකුණ 8. උඩ මැද
9. උඩ වම

II. * රංග භූමිය සමතල බිමක් විය යුතුය.
* රඟපෑමට ප්‍රමාණවත් අවකාශයක් තිබිය යුතුය.
* ප්‍රේක්ෂක පිරිසට පහසුවෙන් නැරඹිය හැකි ලෙස පිහිටා තිබිය යුතුය.
* රංගන ශිල්පීන්ට අවශ්‍ය වන අවම පහසුකම් වලින් වත් රංග භූමිය සමන්විත විය යුතුය.
(ල.05)

06.

I. E.F.C. ලූඩෝවයික් (ල.02)

II. ඉබේ වෙදා , යන්තම් ගැළවුනා , පුදුම බේරිල්ල , මුදලාලිගේ පෙරලිය , කපුවා කපෝති , වෙදා හටන , රහස් කොමසාරිස් (ල.04)

III. පරිවර්තන හා අනුවර්තන නාට්‍ය පිළිබඳ මූලික හැඳින්වීමක් කර උදාහරණ දකුවා ඇතිනම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. (ල.05)

07. පිටපතෙහි ගුණාත්මක භාවය සලකා බලා ලකුණු ලබා දෙන්න.

I. නාට්‍යෝචිත අවස්ථා ගොඩනැගීම. (ල.04)

II. සංවාද හා රංග විධාන සහිත පෙළ රචනා කිරීම සඳහා ලෙස ලකුණු ප්‍රදානය කරන්න.
(ල.08)